# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2017 දෙසැම්බර් මස 08 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2017.12.12 දින නිකුත් කරන ලදී)**


## වෛද්‍ය (සංශෝධන)

**(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 18.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## *නීතිය බලපෑමේ ප්‍රකාශය*

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ ) වෛද්‍ය ආඥාපනතේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ වෛද්‍ය සභාවට විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනකු සහ එක් විශේෂඥ දන්ත වෛද්‍යවරයකු ඇතුළත් කිරීම මගින් එහි සාමාජිකයන් සංඛ්‍යාව වැඩි කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ හා විශේෂඥ දන්ත වෛද්‍යවරුන්ගේ නම් ඇතුළත් වූ නාමලේඛනයක් පවත්වාගෙන යාමට ලේඛකාධිකාරිවරයාට ඉඩ සැලසීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 39අ, 39ආ සහ 39ඇ අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම සංශෝධනයේ නීතිය බලපෑම වන්නේ-

(අ) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චිතව දැක්වීම ;

(ආ) නිශ්චිතව දක්වන ලද සුදුසුකම් ඇති විශේෂඥ වෛද්‍යවරු සහ විශේෂඥ දන්ත වෛද්‍යවරු වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීමට විධිවිධාන සැලැස්වීම ; සහ

(ඇ) විශේෂඥ වෛද්‍යවරයකු හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු වශයෙන් සේවයේ යෙදීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වීම අනිවාර්ය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම,

වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ "වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ යෝග්‍යතා මිණුම් දණ්ඩ", "වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය" සහ "වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය" යන යෙදුම්වල අර්ථ නිරූපණ ඇතුළත් කිරීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනය වන විට අදාළ විශේෂඥ වෘත්තියේ නියැලී සිටි විශේෂඥ වෛද්‍යවරුන්ට සහ විශේෂඥ දන්ත වෛද්‍යවරුන්ට මාස 12ක කාලසීමාවක් ඇතුළත ලියාපදිංචි වීමට හැකි කරවීම සඳහා විධිවිධාන සලස්වයි.

එල්. ඩී. — ඕ. 55/2015

**(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2017 අංක දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

105 වන අධිකාරයේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇඇ) 39 වන වගන්තියේ (1) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් විශේෂඥ වෛද්‍යවරුන් විසින් තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් තිදෙනෙක්;

(ඇඇඇ) 39අ වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විශේෂඥ දන්ත වෛද්‍යවරුන් විසින් තෝරා පත්කර ගනු ලබන එක් සාමාජිකයෙක්;".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අඅ) 39අ වන වගන්තියේ සඳහන් සුදුසුකම් ඇති සහ 39ආ වගන්තිය යටතේ ලියාපදිංචිය ලබාගත් විශේෂඥ වෛද්‍යවරුන් සහ විශේෂඥ දන්ත වෛද්‍යවරුන් සියලු දෙනාගේම නම් ඇතුළත් විශේෂඥ වෛද්‍යවරුන් හා විශේෂඥ දන්ත වෛද්‍යවරුන් පිළිබඳ ලේඛනයක් ;".

2—PL 010466 -475 (2017/11)

ප්‍රධාන ප්‍රඥප්තියට 39අ, 39ආ සහ 39ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 39අ, 39ආ සහ 39ඇ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය. :—

"විශේෂඥ වෛද්‍යවරයකු හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම්.

39අ. (1) වෛද්‍ය සේවා ව්‍යාවස්ථා සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විශේෂඥ වෛද්‍ය නිලධාරි ශ්‍රේණිය සඳහා නියම කර ඇති සුදුසුකමක් ලබා ඇති, 29 වන වගන්තිය යටතේ ලියාපදංචි වූ වෛද්‍ය වෘත්තිකයකුට, 39ආ වන වගන්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ඇත්තේ ය.

(2) වෛද්‍ය සේවා ව්‍යාවස්ථා සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විශේෂඥ වෛද්‍ය නිලධාරි ශ්‍රේණිය සඳහා නියම කර ඇති සුදුසුකමක් ලබා ඇති, 43 වන වගන්තිය යටතේ ලියපදිංචි වූ දන්ත වෛද්‍යවරයකුට, 39ආ වන වගන්තිය යටතේ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ඇත්තේ ය.

(3) ශ්‍රී ලංකාව හැර වෙනත් රටක විශේෂඥ පුහුණුව සාර්ථක ලෙස අවසන් කර, අදාළ විශේෂඥයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ යෝග්‍යතා මිණුම් දණ්ඩ සපුරාලන විශේෂඥ වෛද්‍ය හෝ විශේෂඥ දන්ත වෛද්‍ය සුදුසුකමක් ලබා ඇති, 29 වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයකුට හෝ 43 වන වගන්තිය යටතේ ලියාපංදිචි වූ දන්ත වෛද්‍යවරයකුට, 39ආ වන වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, විශේෂඥ වෛද්‍යවරයකු හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ඇත්තේ ය.

(4) වෛද්‍ය සභාව විසින් පිළිගනු ලබන, ශ්‍රී ලංකාව හැර වෙනත් රටක විශ්වවිද්‍යාලයකින්, හෝ වෛද්‍ය විද්‍යාලයකින් හෝ දන්ත වෛද්‍ය

විද්‍යාලයකින්, වෛද්‍ය විද්‍යාව හෝ දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳව උපාධි සුදුසුකමක් සහ පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා ඇති, අදාළ විශේෂඥයකු ලෙස වෘත්තියේ යෙදීම සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ යෝග්‍යතා මිණුම් දණ්ඩ සපුරාලන යම් තැනැත්තකුට, 39ආ වන වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, විශේෂඥ වෛද්‍යවරයකු හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ඇත්තේ ය.

**විශේෂඥ වෛද්‍යවරයකු හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීම.**

39ආ. 39අ වන වගන්තියේ සඳහන් විශේෂඥ වෛද්‍ය හෝ විශේෂඥ දන්ත වෛද්‍ය සුදුසුකම්වලින් යම් සුදුසුකමක් ලබා ඇති වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු හෝ යම් තැනැත්තකු, ලියාපදිංචි වීම සඳහා නියමිත ගාස්තුව ද සමග නියමිත ආකෘති පත්‍රයේ වූ ඉල්ලීමක් වෛද්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, ඔහු —

(අ) මනා චරිතයකින් යුක්ත වන්නේ නම් ; සහ

(ආ) (i) 39අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් සුදුසුකමක් ඇති වෛද්‍ය වෘත්තිකයකු සම්බන්ධයෙන් වන විට, 29 වන වගන්තිය යටතේ ලියාපදිංචි වීමේ සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම් ; හෝ

(ii) 39අ වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් සුදුසුකමක් ඇති දන්ත වෛද්‍යවරයකු සම්බන්ධයෙන් වන විට, ඔහු 43 වන වගන්තිය යටතේ ලියාපදිංචි වීමේ සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම් ; හෝ

(iii) 39අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් සුදුසුකමක් ඇති වෛද්‍ය වෘත්තිකයකු හෝ දන්ත වෛද්‍යවරයකු සම්බන්ධයෙන් වන විට, ඔහු 29 වන වගන්තිය යටතේ හෝ 43 වන වගන්තිය යටතේ ලියාපදිංචි වීමේ සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම් ; හෝ

(iv) 39අ වන වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් සුදුසුකමක් ඇති තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඔහු මණ්ඩල සහතිකය සඳහා අවශ්‍ය තාවකාලික ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් ; සහ

(ඇ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ යෝග්‍යතා මිණුම් දණ්ඩ සපුරාලීමෙන් පසු එම වෛද්‍ය විද්‍යා උපාධි ආයතනය විසින් නිකුත් කරන ලද, අවස්ථාවෝචිත පරිදි මණ්ඩල සහතිකයක් හෝ මණ්ඩල සහතිකය සම්බන්ධයෙන් ප්‍රතීතන සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම්,

එම වෛද්‍ය වෘත්තිකයා, දන්ත වෛද්‍යවරයා හෝ තැනැත්තා අදාළ වෛද්‍ය ක්ෂේත්‍රයේ හෝ දන්ත වෛද්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥ වෛද්‍යවරයකු ලෙස හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචියක් නොමැතිව කිසිම තැනැත්තකු විශේෂඥ වෛද්‍යවරයකු ලෙස හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු ලෙස වෘත්තියේ නොයෙදිය යුතු බව.

39ඇ. 39ආ වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති විශේෂඥ වෛද්‍යවරයකු හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු නොවන කිසිම තැනැත්තකු විසින් තමා 39අ වන වගන්තියේ සඳහන් සුදුසුකම් ඇති විශේෂඥ වෛද්‍යවරයකු හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු බවට හැඟවීම සඳහා හෝ විශ්වාස කරවීම සඳහා යම් නාමයක්, පදවි නාමයක් හෝ නමට එක් කිරීමක් යොද නොගත යුතු හෝ භාවිත

නොකළ යුතු ය. නැතහොත්, යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මගින් තමා 39ආ වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ විශේෂඥ වෛද්‍යවරයකු හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු බවට යම් තැනැත්තකුට විශ්වාස කිරීමට ද, ඒ විශ්වාසය මත කටයුතු කිරීමට ද, සැලැස්වීම හෝ එසේ කිරීමට ඉඩ සැලසීම, චේතනාන්විතව ම සිදු නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "වතු ඇපොතිකරි" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

""වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ යෝග්‍යතා මිණුම් දණ්ඩ" යන්නෙන්, 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යටතේ සාදන ලද නියෝග මගින් නියම කර ඇති, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අදාළ අධ්‍යයන මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද, අදාළ විශේෂඥතාවය පිළිබඳ මණ්ඩල සහතිකය සඳහා වූ යෝග්‍යතා මිණුම් දණ්ඩ හෝ මණ්ඩල සහතිකය සම්බන්ධයෙන් වූ ප්‍රතීතන සහතිකය අදහස් වේ;";

(2) "වෛද්‍ය වෘත්තිකයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

""වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය" යන්නෙන්, කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි, 2014 ඔක්තෝබර් මස 11 වන දින සහ අංක 1883/17 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද, වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය අදහස් වේ;";

(3) "ඖෂධවේදියා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

""වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ සාදනු ලැබ, 1980 අප්‍රේල් මස 10 වන දින

අංක 83/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, කලින් කල සංශෝධිත පරිදි වූ, 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය මගින් පිහිටුවනු ලැබූ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අදහස් වේ;”.

වෘත්තියෙහි යෙදී සිටින විශේෂඥ වෛද්‍යවරුන්ට සහ විශේෂඥ දන්ත වෛද්‍යවරුන්ට ආදළ අන්තර්කාලීන විධිවිධාන.

**6.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී 39ආ වන වගන්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු ලෙස හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන යම් සුදුසුකමක් ලබා ඇති සහ එම දිනයට පෙර අදාළ විශේෂඥයකු ලෙස වෘත්තියෙහි නියැලී සිටින සෑම වෛද්‍ය වෘත්තිකයකු හෝ දන්ත වෛද්‍යවරයකු ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස දොළහක කාලයක් ඇතුළත 39ආ වන වගන්තිය යටතේ ලියාපදිංචිය ලබාගත යුතු බවට නියම කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.